# Covide 19 - සති පාසල (සබරගමුව)

9 ශ්‍රේණිය (දෙවන සතිය)

නිපුණතාව 1.0 - සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.1 - ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනියි.

ක්‍රියාකාරකම 1.1.1 - භූපාලි රාගයේ ස්වර අභ්‍යාස

කාලය - විනාඩි 40

ඉහත 1.1.1 ක්‍රියාකාරකමට අදාළව ඔබට සපයා ඇති පහත අංක 01, 02, 03 පැවරුම් සම්පූර්ණ කරන්න.

පැවරුම අංක 01 - (ලිඛිත)

1. රාගධාරී සංගීතය පිළිබඳව ඔබ පෙර උගත් දැනුම භාවිත කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. රාගයක් බිහිවීම සඳහා අවශ්‍ය වන අවම ස්වර සංඛ්‍යාව ලියා දක්වන්න.

II. සියලු ම ස්වර ශුද්ධ ව යෙදෙන සම්පූර්ණ ජාති රාගය නම් කරන්න.

III. බිලාවල් රාගයේ ආරෝහණ, අවරෝහණ, වාදි සංවාදි ගානසමය ලියා දක්වන්න.

IV. ස්වර අභ්‍යාස සඳහා යෙදෙන තවත් නමක් ලියා දක්වන්න. (විනාඩි 20යි.)

පැවරුම් අංක 02

1. මන්නාරම් පිට් වැල්ලේ, මධුර යාමේ, සටනෙකි ජීවිතේ දැන් යන සරල ගීත ශ්‍රවණය කරන්න. එම ගීත නිර්මාණයේදී ස රි ග ප ධ ස්වර පමණක් භාවිත වී ඇති ආකාරය අධ්‍යයනය කරන්න. (විනාඩි 10)

11. පහත සඳහන් ස්වර අභ්‍යාස ගායනයට/වාදනයට හුරු වන්න.(විනාඩි 10)

- ස රි ග ප ධ ස / ස ධ ප ග රි ස
- ස රි ග රි, ස රි ග ප ග රි, ස රි ග ප ධ ප ග රි, ස රි ග ප ධ ස ධ ප ග රි
- ස රි ග ග රි ස, ස රි ග ප ප ග ග රි ස, ස රි ග ප ධ ධ ප ප ග ග රි ස, ස රි ග ප ධ ධ ස ස ධ ධ ප ප ග ග රි ස

පැවරුම් අංක 03 (පසු වැඩ)

I. සරිගස, සරිගපග-, සරිසරිගස, පපගපගරි යන භූපාලි රාගයට අදාළ ස්වර අභ්‍යාස උච්ච සඩ්ජය දක්වා වර්ධනය කරන්න.